# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT


| | | |
|---|---|---|
| මගේ අංකය<br>**எனது இல**<br>My No DSD/HO05//MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>**உமது இல** ..........<br>Your No | දිනය<br>**திகதி** 2019.09.23<br>Date |

සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍ර ලේඛ අංක - 2019/ 11

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරුවන් වෙත,

**<u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ සංශෝධනය කිරීම හෝ වෙනත් හේතු නිසා සමෘද්ධි බැංකුවල අභ්‍යන්තර සංයුතිය වෙනස් කිරීම හෙවත් සමෘද්ධි බැංකු අතර වසම් මාරු කිරීම</u>**

01 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ මායිම් වෙනස්වීම හෝ එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක බැංකු අතර ග්‍රාම වසම් මාරු කිරීමේදී හඳුනාගත් වත්කම් හා වගකීම් භාරදීම හා භාර ගැනීම පිළිබඳ උපදෙස් මෙහෙයුම් උපදෙස් 24 හා ඊට පළමු එකතුව මඟින් උපදෙස් දී ඇත. එම උපදෙස්වලට අමතරව පහත උපදෙස් අනුව විසර්ජන ගිණුම් ශේෂ මාරු කිරීම සිදු කරන ලෙස දන්වමි.

02 බැංකුවල අභ්‍යන්තර සංයුතිය වෙනස්වීම සමඟ විසර්ජන ගිණුම්වල ශේෂයන් බෙදා හැරීම. එම කාර්යය සිදු කිරීම ද පහත නිර්නායක සම්පූර්ණ වී තිබිය යුතුය.

2.1 සලකා බලන වර්ෂයේ / වර්ෂවල මෙහෙයුම් ලාභයන් උපයා තිබීම.

2.2 විසර්ජන අරමුදල් බෙදා හරිනවිට, එම වර්ෂයේ විගණන වාර්තා අනුමත වී සම්මත වී තිබීම.

2.3 බෙදා වෙන් කර, මෙහෙයුම් ලබන බැංකුවට යැවිය යුතු විසර්ජන ගිණුම් ශේෂ

I. රඳවාගත් ලාභ අලාභ ගිණුම්
II. කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුම
III. පොදු සුභසාධක ගිණුම
IV. සේවක අභිප්‍රේරණ සහ සුභසාධන සඳහා වෙන් කිරීමේ ගිණුම
V. පරිපාලන වියදම් සඳහා වෙන් කිරීමේ ගිණුම
VI. කාර්ය මණ්ඩල සුභසාධක සඳහා වෙන් කිරිමේ ගිණුම


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramu

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | wajira | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

2.4 "මෙහෙයුම් යවන" බැංකුව විසින් ජනවාරි මස 01 දිනට සම්පූර්ණ කරන ලද මුළු කොටස් ගණන හා වෙන් වී යන ග්‍රාම වසම්වල අදාල කොටස් සංඛ්‍යාවට සකස් කරගත යුතුය. ඉන් අනතුරුව, ජේද අංක 2.3 හි සඳහන් විසර්ජන ගිණුම්වලට එක් එක් වර්ෂයේ මාරු කරන ලද ශේෂයන් එම වර්ෂයේ මුළු කොටස් ගණනින් බෙදා වෙන් වී යන වසම්වලට අදාල කොටස් ගණනින් ගුණ කර අගය සොයාගත යුතුය.

**උදාහරණ :-** 2001 මාර්තු මස 25 දින රුවන්පුර සමෘද්ධි බැංකුවට අයත් තිබූ ග්‍රාම වසම් 03 ක් පරිපාලන සීමාවන් හේතුවෙන් මැණික්පුර සමෘද්ධි බැංකුවට එකතු විය. 2001 මාර්තු 25 දිනට රුවන්පුර බැංකුවේ ශේෂ පරීක්ෂණයේ උපුටාගත් ශේෂ කිහිපයක් පහත වේ.

| ගිණුමෙහි නම | වර්ෂ 1999 | වර්ෂ 2000 |
|---|---|---|
| රඳවාගත් ලාභ අලාභ ගිණුම රු. | 275,000 | 300,000 |
| කොටස් කරුවන් ගෙවිය යුතු ලාභාංශ ගිණුම රු. | 120,000 | 150,000 |
| පොදු සුභසාධන ගිණුම රු. | 60,000 | 75,000 |

- රුවන්පුර සමෘද්ධි බැංකුවේ කොටස් සංඛ්‍යාව - 1999 – 500 ක් ද , 2000 වර්ෂයේ 600 ක් ද වේ.
- රුවන්පුර සමෘද්ධි බැංකුවෙන් මැණික්පුර සමෘද්ධි බැංකුවට එකතු වූ වසම් හා කොටස්කරුවන් පිළිබඳ තොරතුරු

| වසම | සාමාජික කොටස් ගණන | |
|---|---|---|
| | **1999 වර්ෂය** | **2000 වර්ෂය** |
| නිල් | 80 | 100 |
| රතු | 90 | 120 |
| කහ | 110 | 130 |
| **එකතුව** | **280** | **350** |

1 මෙහෙයුම් ලබන මැණික්පුර බැංකුවට විසර්ජන ගිණුම් වලින් හිමිවන අරමුදල ප්‍රමාණයන්

| ගිණුමේ නම | 1999 | 2000 |
|---|---|---|
| රඳවාගත් ලාභ අලාභ ගිණුම රු. | 154000 | 175000 |
| කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුම රු. | 67200 | 87500 |
| පොදු සුභසාධක ගිණුම රු. | 33600 | 43750 |
| **එකතුව** | **254800** | **306250** |

2.5 මෙහෙයුම් අලාභයක් ලබා ඇති වර්ෂවල අරමුදල් බෙදියැමක් සිදු නොවන අතර, එමෙන්ම අලාභයක් පෙන්නුම් කරන වර්ෂයට පසුව එළැඹෙන වර්ෂයේ ලාභයක් උපයා ගත් විටක ගෙන රඳවාගත් ලාභ අලාභ ගිණුමට මාරු කරන ලද මුදලින්, පසුගිය වර්ෂයේ අලාභ ප්‍රමාණය ඉවත් කර ඉතිරියක් ඇත්නම් එම ප්‍රමාණය බෙදා මෙහෙයුම් ලබන බැංකුවට ලබාදීමට මෙහෙයුම් ලබන බැංකුවේ වගකීම වේ.

3.0 මෙහෙයුම් ලබන බැංකු අදාල චෙක්පත බැංකු ගත කර උපලබ්ධි වූ පසු විසර්ජන ගිණුම්වලට බැර කර සටහන් තැබීම කළ යුතුය.

4.0 මෙම උපදෙස් හැර අනිකුත් උපදෙස් සඳහා 2008.05.09 දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් 24 හා ඊට එකතුන්හි උපදෙස් අනුගමනය කරන ලෙස දන්වමි.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

01. ලේකම්, ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම්අමාත්‍යාංශය. - කා.දැ.පි.
02. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, - කා.දැ.පි.
03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි.
05. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, - කා.දැ.පි. හා අ.ක.ස
06. සියලුම විධායක කමිටු සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය. - කා.දැ.පි.
07. සියලුම පාලක මණ්ඩල සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකුව. - කා.දැ.පි.